## විශේෂ නිවේදනයයි..!

පාඨකයින් අතර ඉමහත් ආන්දෝලනයකට තුඩු දුන් ත්‍රිත්ව කතා මාලාව, **'එකිනෙකට සම්පූර්ණයෙන්ම වෙනස් වූ කතා ත්‍රිත්වයකින්'** යුක්ත වන අතර ඒ හේතුව නිසාම එම කෘතීන් තුනම එකිනෙකට වෙනස් තනි කෘතීන් ලෙස රසවිඳීමේ හැකියාව පාඨකයාට ඇත.

මෙම කෘතීන් තුනෙහි ඇති එකම සමාන කම, කෘතීන් ත්‍රිත්වයම **'ත්‍රී පාර්ශවික ලිංගිකත්වය'** තේමා කොටගෙන ලිවීම පමණි.

ඔබ මේ කියවන්නේ එහි තවත් කතාවක් වන 'වීනස්' නවකතාවයි. මා මෙතෙක් ලියූ සෑම නවකතාවක් මෙන්ම 'වීනස්' ද වෙනස්ම ආරක නවකතාවකි. එය සමලිංගිකත්වය, පරපීඩා කාමුකත්වය, දේවත්වය සහ මිථ්‍යා දෘෂ්ටිය සියුම්ව ස්පර්ශ කරන්නකි. ශ්‍රී ලාංකීය සාහිත්‍යට මෙතෙක් නොලියූ **'ජීවිත වල වෙනස්ම පැතිකඩක්'** කරළියට ගෙන එන්නකි. ත්‍රිත්ව මුල් පොත මෙන්ම මෙයත් පාඨකයින් අතර 'අතිශයින් ජනප්‍රිය' වනු නිසැකයි.
එසේනම් කියවන්න,

මේ **'වීනස්'**

"ආදරයට කොහෙන්ද කෙල්ලෙ අසම්මතයක්"

**වීනස්**

ප්‍රථම මුද්‍රණය : 2021 නොවැම්බර්

**2021 © මුතුමුදලිගේ නිශ්ශංක**

**ISBN** 978-624-5552-03-0

**සෝදුපත් පරීක්ෂාව** - චින්තක වීරේන්ද්‍ර

**පිටු සැකසුම** - කාවින්ද්‍යා රත්නායක

**කවර නිර්මාණය** - ප්‍රදීප් ප්‍රේමලාල්

**මුද්‍රණය**

නියෝ ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම

44, උඩහමුල්ල දුම්රිය පොල පාර,

ගංගොඩවිල, නුගේගොඩ

0112 820 220 - info@neo.lk

**පොත්මී ප්‍රකාශන**

Muthumudalige Holding's pvt Ltd.

K. Cyril C Perera Mw,

Kotahena, Colombo. 13

කර්තෘගේ අවසරය නිසි පරිදි ලිඛිතව නොලබා මෙහි එන කිසිවක්ම, කවර ආකාරයකින් හෝ නැවත පළ කිරීම තහනම් වෙයි. එම තහනමට: අත් අකුරින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, ශ්‍රව්‍ය හෝ රූපණ ප්‍රකාශන ලෙස නිර්මාණය කිරීම, ඊ-බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුලත් බව සලකන්න.

**සියලුම හිමිකම් ඇවිරිණි.** මුතුමුදලිගේ නිශ්ශංක 2021


Julie Jan,
This book is dedicated to you.

# 01

**දුරකථනය** නාද විය.

"ලෝරා, ඔබව මුණගැහෙන්න කවුද ඇවිත් ඉන්නවා"

එහා කොනෙන් ඇසුණේ 'ප්‍රෝවෝ' පොලිස් ස්ථානයේ සම්බන්ධීකරණ නිලධාරිනියගේ කටහඬයි. ඒත් ලෝරා ඒ වනවිටත් උදැසන රැස්වීම් වාරයට යාමට සූදානම් ව සිටි නිසාවෙන් ඇය ඒ ගැන වැඩි තැකීමක් නොකළාය. මේසය මත වූ ෆයිල් කවර කිහිපය අතට ගත් ඈ රිසීවරය කනේ තබාගෙනම එම ෆයිල් කවර විවර කර රැස්වීමට අවශ්‍ය කරන වාර්තා සියල්ලම එහි ඇත්දැයි බැලුවාය. ඒ අතර ඇගේ අවධානය යළිත් ඇමතුමට යොමු විය.

"කවුද? මොකක්ද වුවමනාව"

ඇය වේගයෙන් ඇසුවාය.

"දන්නෑ මැඩම්, හේතුවක් කියන්නේ නැහැ. ලොකු නෝනව මුණගැහෙන්න ඕන කියලා විතරක් කියනවා"

"මොකක්..?"

ලෝරා ගේ දෑසට කෝපයක් ආරූඪ විය. ඇය දෑස් ඔසවා කාර්යාල බිත්තියේ වූ ඔරලෝසුව දෙස බැලීය. වේලාව නවයට ආසන්නව ඇත. මෙය විනාඩි පහළොවක් පුරා ඇදෙන ඉතාමත් කෙටි රැස්වීමක් වුවත් එය පොලිස් ස්ථානයේ නිලධාරීන් සඳහා

විශේෂ එකකි. එදින දවස පුරාවටම සිදුවිය යුතු මෙහෙයුම් සඳහා නිලධාරීන් පත් කිරීම සහ ඔවුන්ගේ වැඩ කොටස් පැවරීම සිදුවන්නේ මෙමගින් නිසාවෙන් එයට පොලිස් ස්ථානයේ ප්‍රධානියා ලෙස 'ලෝරා රොද්‍රිගස්' අනිවාර්යෙන්ම සහභාගී විය යුතුය. ඊටත් වඩා උදැසන රැස්වීම ආරම්භ කිරීමට ඇත්තේ තවත් මිනිත්තු කිහිපයක් පමණි. මේ වනවිටත් අනෙකුත් නිලධාරීන් ඇය එන තුරු රැස්වීම් ශාලාවේ අසුන්ගෙන සිටිනවා විය යුතුය.

"ජෝඩි.."

ඇය යළිත් පිළිගැනීමේ නිලධාරිනියට කතා කළාය.

"ඔව් මැඩම්"

"කරුණාකර එයාට විනාඩි පහළොවක් ඉන්න කියන්න, එහෙම නැත්නම් කැප්ටන් සාර්ස් ගේ කාමරයට යවන්න, කියන්න මම දැන් රැස්වීමක කියලා"

ඇය කීවේ එපමණකි. රිසීවරය යළිත් දුරකථනයේ ඇටවූ ඇය ෆයිල් කවර කිහිපයත් තුරුලු කරගෙන කාමරයෙන් එළියට දිව ගියාය.



ඇය යළිත් කාර්යාලයට ආවේ විනාඩි පහළොවකට පසුය. ඒ ආ විගසම අතේ තිබුණු ෆයිල් කවර කිහිපය කාමරයේ තැබූ ඇය පහත මාලයට යන්නට පටන් ගත්තාය. ඇයව මණගැසීමට පැමිණි තැනැත්තා තවමත් ඇය එනතුරු බලා සිටිනවා විය හැක. එසේ නැතහොත් එම පුද්ගලයා කැප්ටන් සාර්ස් ගේ කාමරයට යන්නට ඇත. එයත් විපරම් කොට ගොඩනැගිල්ල ඉදිරියේ ඇති කරාස් අවන්හලට ගොස් 'කෝපි' කෝප්පයක් පානය කොට යළිත් රාජකාරියට පැමිණිය යුතුය.

ලෝරා රොද්‍රිගස් නොහොත් ප්‍රෝවෝ පොලිස් ස්ථානාධිපතිනිය තඹ පැහැ කොණ්ඩයකින්ද, උස් සිරුරකින්ද යුක්ත වයස අවුරුදු 40ක පමණ කෙනෙකි. ඇය ප්‍රියමනාපය. කෙතරම් රාජකාරි බහුල දිනයක වුවත් ඇයගේ මුහුණේ ඇති සිනහව අඩු වී ගියේ නැත.

ඒ නිසාම කොරිඩෝව දිගේ පහත මාලයට යන මේ මොහොතේ වුවත් ඇය කොරිඩෝව දෙපැත්තේ ඇති කාමර වල සේවය කරන තම සගයන් දෙස බලමින් සිනාමුසු මුහුණින් ගමන් කළාය. එසේ යමින් ගමන් ඇය පහත මාලයේ ඇති පිළිගැනීමේ කවුළුව අසල නතර වූවාය. එතැන සිටියේ තද නිල් පැහැ නිල අඳුමින් සහ පොලිස් හිස් වැසුමින් සැරසුණු තරුණ කාන්තාවකි. ලෝරා තමා අසලට පැමිනෙණු දුටු ඇය මුව පුරා නගා ගත් සිනහවකින් ලෝරාට ආමන්ත්‍රණය කළාය.

"මැඩම්"

"ජෝඩි, කොහොමද ඔයාට?"

ලෝරා ද ඇය අසලටම ළංව ළෙංගතු සිනහවකින් ඇය සමග කතා කළාය.

"හොඳයි ලෝරා, ඔයාට කොහොමද?"

"අද ටිකක් රාජකාරි බහුල දවසක්, කෝ අර මාව මුණගැහෙන්න ආවයි කිව්ව කෙනා, එයාව කැප්ටන්ගේ කාර්යාලයට යැව්වද?"

ලෝරා එසේ අසත්ම ජෝඩි ඇය ඉඳ සිටි ආසනයෙන් මඳක් එසවී, ඇය ඉදිරියේ තිබුණු පුටු පේළිය දෙසට බැල්මක් හෙළීය. ඇයගේ දෑස් එක් වරම පුංචි වී ගියාය. එම ආසන පේළියේ මිනිසුන් කිහිප දෙනෙකුම වාඩි වී සිටි නමුත් ලෝරා ව මුණග ැසීමට පැමිණි තැනැත්තා එතැන සිටියේ නැත.

"එයා දැන් ටිකකට කලිනුත් මෙතැන හිටියා"

ජෝඩි තවත් පරීක්ෂාකාරීව අවට ශාලාව දෙස බලන ගමන් කීවාය.

"මොන වගේ කෙනෙක්ද?"

"කළු සමක් තියෙන කෙල්ලෙක්, අත් වාරුවකින් යන කෙනෙක්"

ලෝරා ගේ දෑස් හැකිලින.

"මොකක්?"

"ඔව්, මම හිතන්නේ ඉන්දියානු කෙල්ලෙක් වෙන්න ඕන"

ලෝරා ජෝඩි සමගම ශාලාව හරහා ඇති කාර්යාල කාමර පේළිය දෙස විපරමෙන් බැලුවාය. ඒත් ඇය කියූ ආකාරයෙන් අත් වාරුවකින් යන ඉන්දියානු කෙල්ලෙක් ඒ කිසිම තැනක නැත.

"එයා එහෙනම් එළියට යන්න ඇති"

අවසානයේදී ජෝඩි සුසුමක් හෙළා යළිත් ඇයගේ ආසනයේ වාඩි වූවාය.

ලෝරා ඇය අතෙහි වූ ජංගම දුරකථනය විවෘත කර එහි වේලාව බැලුවාය. වෙලාව ඒ වනවිටත් දහයයි තිහට ආසන්නය. ඇය ඉක්මන් කළ යුතුය. ආපණශාලාවට ගොස් සිගරට්ටුවකුත් කෝපි කෝප්පයකුත් පානය කර යළිත් තම රාජකාරිය පටන් ගැනීමට කාර්යාලයට පැමිණිය යුතුය. අවසන් වතාවටත් ශාලාව දෙසට දෑස් යැවූ ලෝරා යළිත් ජෝඩි දෙසටම හැරුණාය.

"ජෝඩි, එයා ආයේ ආවොත් මගේ මොබයිල් එකට කෝල් එකක් ගන්න"

කී ඇය ජෝඩිට පෑ සිනහවකුත් සමග එතැනින් නික්ම ලහි ලහියේ පොලිස් ස්ථානයේ ප්‍රධාන දොර අසලට පිය නැගුවාය.



ප්‍රෝවෝ පොලිස් ස්ථානය තට්ටු තුනක සුවිසල් ගොඩ නැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල ඉදිරියෙන් යූටා අධිවේගී මාර්ගයත්, එයට යාබදවම කරාස් ආපණශාලාවත් පිහිටා තිබුණි. ගොඩනැගිල්ලෙන් එළියට එත්ම ඇත්තේ පටු පදික වේදිකාවයි. මේ උදෑසන කාලය වූ බැවින් යූටා මාවත් කාර්යබහුල වී ඇත. මාර්ගය පුරාම වාහන වේගයෙන් ගමන් කළ අතර, දිගු මගී බස් එක පේළියට මාර්ගය මැදින් ගමන් කරමින් තිබුණි. ලෝරා ප්‍රධාන දොරටුවෙන් එළියට විත් කලින් කී පදික වේදිකාව දිගේ ආපණශාලාව දෙසට යමින් සිටියාය.

හරියටම මේ මොහොතේ, පදික වේදිකාවේ හිටගෙන සිටි

තරුණ කාන්තාවක් අධිවේගී මාර්ගය හරහා පාර පනින්නට විය. ඇයගේ එක් පාදයක් වෙළුම් පටි වලින් බැඳ තිබුණු අතර ඇය අතෙහි අත් වාරුවක් විය. ආයාසයකින් දැඩිව අල්ලාගත් අත් වාරුවත් සමග මාර්ගය මැදටම ගමන් කළ ඇය, මාර්ගය මැදදී අත් වාරුවත් විසිකර දමා ඇය ඉදිරියට වේගයෙන් ඇයදී එන බස් රථයකට මුහුණලා දැඩි බැල්මකින් යුතුව සෘජුව හිටගත්තාය.

බස් රථයේ රියැදුරා ඇතදීම ඇයව දකින්නට ඇත. ඔහු තිරිංග තදකොට බස් රථය දකුණට කැපුවේය. ආ වේගයෙන්ම එය පදික වේදිකාවත් කඩාගෙන ඒ අසල වූ කොන්ක්‍රීට් කණුවක හැපී නතර විය. ඒ හඬින් තිගැස්සී ගිය ලෝරා එදෙස බැලුවාය.

අර කාන්තාව තවමත් එතැනම හිටගෙන සිටියි. ඇයගේ දෑස් නිර්භයව ඇය ඉදිරියට එන මරණය වැළඳ ගැනීමට සූදානමිනී මෙන් මාවත දෙසටම යොමු වී ඇත. මාර්ගයෙන් ඉවතට විසී වී ආ බස් රථයත්, තවමත් මාර්ගය මැද හිටගෙන සිටින කාන්තාවත් දුටු ලෝරා කෑ ගැසුවාය.

"ඔතනින් අයින් වෙන්න"

ඒත් ඇයට එය ඇසෙන පාටක් නැත.

ටික මොහොතකින්ම මාවත පුරා එක දිගටම නලා හඬ රැව් දෙන්නට පටන් ගත්තේය. කාන්තාව බේරමින් වේගයෙන් ගමන් කරන වාහන සියල්ලම එක පිට එක හැපෙන්නට විය. ලෝරා ඉක්මන් කළාය. ඇය එම කාන්තාව දෙසට දුවන්නට පටන් ගත්තාය.

"ඔතනින් අයින් වෙන්න"

ඇය දුවන ගමන් කෑ ගසා කීවාය. ඒත් සමගම ලෝරා ට ජෝඩි කියූ දෙයක් මතක් විය.

'ඉන්දියානු කෙල්ලෙක්, අත් වාරුවකින් යන කෙනෙක්'

ලෝරා ගේ දෑස් විශාල විය. මේ නිසැකවම ඇය විය යුතුය.

"ඔතැනින් අයින් වෙන්න"

ඇය යළිත් කෑ ගැසුවාය. ඒ අතර තම දැත් ඉහළට ඔසවමින්,

ඇය ඉදිරියට එන වාහන නවත්වන්නට වෙර දරමින් එම කාන්තාව දෙසට හැකි තරම් වේගයෙන් දුව යන්නට විය.

ඒත් ගත වූයේ නිමේෂයකි. ඈත සිට වේගයෙන් ආ 'වෙවී' ට්‍රක් රථයක් එම කාන්තාවගේ ඇගේ හැපුණෙන් ඇයව එතැනින් මීටර දහයක් පමණ ඈතට විසි වී බිම ඇද වැටිණ. තවත් කළ හැක්කක් නොමැත. ලෝරා ගල් ගැසී එතැනම හිටගත්තාය.

"මොන අපරාධයක්ද..."

ඇය දැතම තම හිස මත තබා ගත්තාය. ඇයගේ මනස තත්පර කිහිපයකට විසංධි වී යනු ඇයට දැනිණ. ඇය වේගයෙන් හුස්මක් ඉහළට ගෙන ට්‍රක් රථයට හැපී මීටර් කිහිපයක් එහාට විසිවී ගිය ඒ සිරුර දෙස බැලීය. ලෝරා ඒ දෙස බලා සිටියදීම එම සිරුර කිහිප වාරයක් ගැස්සෙන්නටත් ඉන්පසුව එක් වරම චලනය වන්නටත් විය. ලෝරාගේ දෑස් පුදුමයෙන් වික්ෂිප්ත වී ගියාය.

"නැත... ඇය තවමත් මිය ගොස් නැත"

ලෝරා ඒ දෙසට යළිත් දිව යන්නට විය. ඒ දුවන ගමන් තමා පිටුපස සිටි පොලිස් නිලධාරියෙකු දෙස බැලූ ඇය,

"ඉක්මනට වාහනයක් ගේන්න"

යැයි කෑ ගසා කීවාය.

ලෝරා ඇය අසලට පැමිණි විගසම එතැන වැටී සිටි තරුණිය යළිත් නැගිටින්නට වෑයම් කළාය. ඒත් අනතුර නිසාවෙන් ඇයගේ හිසෙන් පැත්තක් පහතට නැමී ඇත. එතුළින් ගලා ආ රුධිරය විලක් මෙන් ඇයගේ ශරීරය දිගේ දිව විත් පොළොව වෙළාග නිමින් සිටියි. තම රුධිරයත්, හිසෙහි වූ තුවාලයත් දැකීමෙන් ඇය කම්පනයට පත් වන්නට ඇත. පහතට නැමී තිබුණු හිසෙහි මස් කැබැල්ලත් අතකින් අල්ලාගෙන ඇය එක් වරක් හිටගත්තාය. ඒත් ඒ තත්පර කිහිපයකට පමණි. යළිත් සිහි විසඳූ වූ ඇය තම රුධිරය මතම ඇද වැටුණාය. ලෝරා ඒ සැනෙකින්ම ඇයව අල්ලා

ගත්තාය. තම පොලිස් කබාය ගලවා ගත් ඇය එය තරුණියගේ හිස වටා ඔතා ඇයව තම උකුළ මතට ගත්තාය. ඒ මොහොතේම පොලිස් ස්ථානය අසල නවතා තිබුණු පොලිස් කාරයක් එම ස්ථානය කරා වේගයෙන් ඇදී එන්නට විය. ලෝරා තරුණියවත් තුරුලු කරගෙන එය තමා අසලට එනතුරු බලා සිටියාය. කාරය ඇය අසලටම විත් නතර විය. එය නතර කරත්ම තරුණියවත් වැරෙන් ඔසවා ගත් ඇය ඒ දෙසට යන්නට පටන් ගත්තාය. කාරය තුළ සිටි නිලධාරියා එහි දොර විවර කළේය.

"ඉක්මනට රෝහලට යන්න..."

ලෝරා ඇයව කාරයෙහි හින්දවන ගමන් කීවාය. ඔවුණට වැඩි වේලාවක් නැත. අනතුරින් ඇයගේ හිසට දැඩි හානියක් වී තිබුණෙන් ඇයව ඉක්මනින්ම රෝහල් ගත නොකළ හොත් ඇය මිය යනු ඇත.

"ඇස් අරින්න.. ඇස් අරින්න..."

ඇයව කාරයේ පිටුපස ආසනයේ තැබූ පසුව ඒ අසලම ඉඳගත් ලෝරා ඇයගේ හිසෙන් ගලා යන රුධිරය නැවැත්වීමට වෑයම් කරමිනී එක් අතකින් සිහි සුන්ව සිටි කාන්තාවගේ කම්මුල් සොලවන්නට පටන් ගත්තාය. ඇයගේ හිසින් රුධිරය තවමත් ගලා ගෙන යන බැවින් ඇය සිටින්නේ දැඩි අවදානමකය. ඒත් මෙවන් මොහොතක අනතුරට ලක් වූ තැනැත්තා රෝහල් ගත වන තුරුවත් සිහියෙන් සිටීම වැදගත්ය. එය මියැදෙන්න යන ජීවිතය අල්ලා තබා ගැනීමට පහසුවක් වනු ඇත.

"ඇස් අරින්න... ඇස් අරින්න..."

ඇය තරුණියගේ කම්මුල් සොලවන ගමන් ඇය අසලට නැඹුරුව ඇයට ඇසෙන්නට යළි යළිත් කෑ ගැසුවාය. ඒත් ඇය දෙනෙත් විවර නොකළෙන් ලෝරා ඇය අසල වූ වතුර බෝතලයක් ගෙන එය ඇයගේ මුහුණට ඉස්සාය. ඒත් සමගම තරුණිය ඇයගේ දෑස් විවෘත කොට ලෝරා දෙස බැලුවාය.

"ඔහෝමම ඉන්න... ඔහොමම ඉන්න.. තව ටිකකින් අපි රෝහලට යනවා. එතකන් අල්ලගෙන ඉන්න... ඇස් වහන්න

එපා... කොහොම හරි අල්ලගෙන ඉන්න.."

ලෝරා ඇයගේ දෙනෙත් තුළට එබී කතා කරන්නට පටන් ගත්තාය. ඇය අනිත් අතින් තරුණියගේ හිස අල්ලා සිටියෙන් එහි ඇඟිලි පුරුක් අතරින් රුධිරය ගලා යනු ලෝරාට හොඳටම දැණින. ඇය ජැකට්ටුව තවත් හිසට කර තද කළාය. ඒ අතර ඇයගේ දෑස් තරුණියගේ දෑස් වලටම යා වී තිබුණි.

"මම එයාව මැරුවා.... ෆෙලී.... මම එයාව මැරුවා.."

තරුණිය මුමුණන්නට පටන් ගත්තාය.

ඒ අනපේක්ෂිත වචන වලින් ලෝරාගේ දෑස් වික්ෂිප්තව ගියාය. ඇය එය, මෙම මොහොතේ කිසිසේත්ම අපේක්ෂා නොකළ දෙයකි.

"කාවද ඔයා මැරුවේ?"

ඇය තරුණියගේ මුහුණ අසලට ළංවී විමසුවාය. ඒත් ඇයගේ දෑස් යළිත් වැසී යමින් තිබුණි. දැඩි වේදනාවකිනුත්, කම්පනයකිනුත් ඒ දෑස් වෙලී තිබුණි. ඊටත් වඩා ලෝරා ඇයගේ දෑස් අසලට එබෙද්දී ඒවා විශාල වී ගියාය. ඇය ලෝරාගේ හිස කෙස් පිරිමදින්නට උත්සාහ කළාය.

"ෆෙලී... මගේ ෆෙලී..."

ඇය සෙමෙන් මුමුණන්නට පටන් ගත්තාය. ඒත් ඒ තත්පර කිහිපයකට පමණි. ඇය යළිත් සිහි විසංඥ වූවාය.

♡

ඇයව රෝහලට ඇතුළත් කළ පසුව ලෝරා යළිත් පොලිස් ස්ථානයට ආවේ නොසන්සුන්වය. ප්‍රෝවෝ පොලිස් ස්ථානයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වෙත්ම එහි ඉදිරියෙන්ම ඇත්තේ සහායක නිලධාරීන් සිටිනා කාමර පේළියයි. එහි එක් කාමරයක ලෝරාගේ සහයකයා වූ උප පොලිස් පරීක්ෂක එරික් රොබින්සන් ඉඳගෙන සිටියේය. එරික්ගේ කාමරයට ඇතුළු වූ ලෝරා එහි දොර වසා දැමුවාය.

"එරික්..."

ඇය ඔහුට කතා කළාය. ඇයගේ නිල ඇඳුම මුළුමනින්ම රුධිරයෙන් වැසී ගොස් ඇත. ඒත් ඒ ගැන අවධානයක් යොමු කිරීමට තරම් යහපත් මනසක් ඇයට නොතිබුණි. තරුණියව රෝහලට ඇතුළත් කළත් ඇයගේ තත්වය අවදානම් සහගත බැවින් ඇයව මොනම මොහොතක හෝ මිය යා හැක. ඒ ගැන දැඩි වේදනාවක් ලෝරාගේ සිත තුළ විය. ඒත් ඊටත් වඩා ඇයගේ මනස තවත් දෙයක් නිසා කැළඹී තිබුණි.

"ඇය කළ මිනී මැරුම කුමක්ද? ෆෙලී කවුද?"

පොලිස් ස්ථානයන් කිහිපයකම වසර විස්සකට වඩා අධික කාලයක් රාජකාරි කර තිබුණු ලෝරා රොද්‍රිගස්ට තරුණිය විසින් කියූ එම අනපේක්ෂිත වූත්, අහඹුවූත් වචන කිහිපය අමතක කළ නොහැකි විය. සමහර විට ඇය සිහි විකලෙන් සිටි නිසාවෙන් එය කියන්නට ඇත. නැතහොත් ඇයගේ මනසේ වූ කැළඹීමත් කම්පනයත් නිසා එය පිට වෙන්නට ඇත. ඒත් මෙය අහම්බයක් ලෙස නොසලකා හැරීමට ලෝරා සූදානම් නොවීය. රෝහලෙන් පිටවූ විගසම ලෝරා රුධිරය පිරුණු වස්ත්‍ර පිටින්ම තම සේවා ස්ථානයට ආවේ ඒ නිසාවෙනි.

තමා ඉදිරියේ රුධිරයෙන් පිරුණු වස්ත්‍රත් සමග හිටගෙන සිටි ලෝරාව දුටු එරික් පුදුමයට පත් විය. ඔහු තම ආසනයෙන් නැගිට කලබලයෙන් ඇය අසලට ආවේය.

"ලෝරා... ඔයා හොඳින් නේද?"

"ඔව්.... ඔව්... මට ප්‍රශ්නයක් නැහැ එරික් ... ඒත් අර කෙල්ලට අසාධ්‍යයි... එයා මොනම මොහොතක හරි මැරෙන්න පුළුවන්... "

කී ලෝරා මඳ වේලාවක් නිහඬව සිට ආයෙත් කතා කළාය.

"එරික්... මට ඒ කෙල්ල ගැන හැම දෙයක්ම දැනගන්න ඕන.. හැම දෙයක්ම..."

ඇය ඉතා තියුණු හඬකින් කීවාය.

"ඒක සිය දිවි නසාගැනීමක් විතරක් නෙමෙයි.... ඊටත් වඩා

දෙයක් එතැන තියෙනවා... ඒ නිසා මට හැම තොරතුරක්ම ඉක්මනට හොයා ගන්න ඕන"

ඇයගේ වචන වලින් එරික් තුෂ්ණිම්භූත විය.

"ඒක සිය දිවි නසා ගැනීමක් විතරක් නෙමෙයි කිව්වේ මොකක්ද? ලෝරා ඒ කෙල්ල පාර මැදට ගියේ තනියෙම... මම දැනටමත් ඒ සීසීටීවී පරික්ෂා කරන ගමන්"

එරික් තම කාමරයේ වූ පරිගණක තිරය දෙසට ඇඟිල්ල දික් කරමින් කීවේය.

ලෝරා එරික්ගේ දෙනෙත් දෙස හරි කෙලින් බැලුවාය. එරික් ලෝරාත් සමග වසර කිහිපයක්ම ප්‍රෝවෝ පොලීසියට අනුයුක්තව සේවය කර ඇති නිසාවෙන් ඔහුට සැඟවීමට දෙයක් ඇයට නැත.

"එරික්.."

ඇය ඔහු අසලට වඩාත් ළං විය.

"ඒක සියදිවි නසා ගැනීමක් විතරක් නෙමෙයි, මම ඒ කෙල්ලව රෝහලට අරන් යද්දි එයා මට මිනීමැරුමක් ගැනත් කිව්වා. මේක සියදිවි නසා ගැනීමටත් එහා ගිය එකක්.. ඒකයි මම කියන්නේ... ඒ කෙල්ල ගැන හොයන්න පටන් ගන්න... දැන්මම"

කී ඇය එරික්ගේ දෑස් දෙස යළිත් තියුණු බැල්මක් හෙළා එතැනින් පිටව ගියාය.

පැය කිහිපයක්ම ඒ ගැන තැකීමක් නොකළ නිසාවෙන් තරුණියගේ හිසින් නික්මුණු රුධිරය ලෝරාගේ ඇඳුම් මතම ඝන වී ඒවා ඇයගේ සමටත් ඇලී ගැලී ඇත. තම කාර්යාලයේ දොර වසා දැමූ ලෝරා කිසිම ගාණකින් තොරවම ඇයගේ උඩු ඇඳුම ගලවා එතැන ලෝගු එල්ලනයේ එල්ලා, එහි තිබුණු ජැකට්ටුවක් ගෙන ඇඟට දමාගත්තාය. ඉන්පසුව තම රාජකාරී මේසයට ගිය ඇය පුටුවේ හොඳින් ඉඳගත්තාය.

තවත් සුළු මොහොතකින්ම තරුණිය මිය යා හැක. එසේත්

නැතහොත් ඊටත් වඩා අනපේක්ෂිත දෙයක් සිදුවිය හැක. ඒත් ඇයගේ අතින් මිනීමැරුමක් සිදුවී ඇත්නම් එහි පරීක්ෂණ හැකි ඉක්මනින්ම ආරම්භ කළ යුතුය. ඇය තම දැස් ඉදිරිපිට වූ පරිගණකය දෙස බැලුවාය.

'තරුණිය සිය දිවි නසාගැනීමට පෙර පොලිස් ස්ථානයට ආවානම් එසේ එන්නට ඇත්තේ කුමක් හෝ විශේෂ හේතුවකට විය යුතුය. එක්කෝ ඇය එන්නට ඇත්තේ තමා කළ මිනීමැරුම ගැන පාපොච්ඡාරණයක් කිරීමටය, එසේත් නැතහොත්, වෙනත් කාර්යකට වුවත් විය හැක'

ඇය තම පරිගණකයේ වූ සීසීටීවී දත්ත ඇතුළත් ෆෝල්ඩරය විවර කළාය. එහි එම මොහොතෙත් පොලිස් ස්ථානය තුළ සිදුවන සියලුමදේ මෙන්ම ඊට පෙර සිදුවූදේද ගබඩා වී ඇත. ඇය එහි වූ වීඩියෝ දත්ත අතරට ගොස් උදෑසන නවයේ සිට පොලිස් ස්ථානයේ පිළිගැනීමේ කවුළුව අසල සිදුවූ සෑම දෙයම පරීක්ෂා කරන්නට පටන් ගත්තාය. එහි සිදුවූ සියලුම දේ ඒ ආකාරයෙන්ම සටහන් වී තිබුණි.

හරියටම උදෑසන නවයේ කණිසමට තරුණිය පොලිස් ස්ථානයට එන අයුරුත්, ඇය විත් ජෝඩි සමග කතා කොට එතැන වූ පුටුවකින් ඉඳගන්නා අයුරුත්, ඉන් විනාඩි දහයකට පමණ පසුව ඇය එතැනින් නැගිට වට පිට බලා ගොඩනැගිල්ලෙන් පිටතට ඇවිද යන අයුරුත් එහි සටහන් වී තිබුණි. ලෝරා එම වීඩියෝව දෙස පරීක්ෂාවෙන් බලා සිට ඇය අසල වූ දුරකථනයෙන් ජෝඩිට ඇමතුමක් ගත්තාය.

"ජෝඩි.... ඉක්මනට මගේ කාර්යාලයට එන්න"

———♡———

කළු හිසකෙස් වලින්ද, පැහැපත් සමකින්ද යුක්ත වූ ජෝඩි පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ නවක නිලධාරිනියකි. ලෝරාගේ කාමරය ඉදිරියට පැමිණි ඇය දෙවරක් තට්ටු කොට එයට ඇතුළු විය.

"මැඩම්"

ඇයගේ මුහුණේ වූයේ මඳ චකිතයකි. උදෑසන සිදුවූ සියදිවි නසාගැනීමත්, එම කාන්තාව අනතුරට මොහොතකට පෙර තමා සමග කතා කිරීමත් නිසා ජෝඩිගේ හදවත තුළ සියුම් තැති ගැන්මක් ඇතිවී තිබුණි. ජෝඩි කාර්යාලයට ආ විගසම ඇයගේ කටහඬින් එහි වූ තැති ගැන්මත් හදුනා ගත් ලෝරා, ඉඳ සිටි පුටුවෙන් නැගිට ඇය අසලට ගියාය.

"ජෝඩි.... ඒ කෙල්ලව රෝහලට ඇතුළු කළා... තව ටික වෙලාවකින් එයාට සනීප වෙයි"

කී ඇය එතැන වූ මේසයට හේත්තු විය. ජෝඩිගේ දෑස් ලෝරා දෙස එක එල්ලේම යා වී ඇත.

"ජෝඩි... මේ කෙල්ල ඔයාට මුකුත්ම කිව්වේ නැද්ද? පොලීසියට ආපු කාරනාව එහෙම"

ලෝරා ඇයගෙන් ඇසුවාය.

"නැහැ මැඩම්, මට කිව්වේ 'ඔබව' මුණගැසෙන්න ඕන කියලා විතරයි"

"මගේ නම කිව්වද?"

"නැහැ"

"එහෙනම්"

"ලොකු මැඩම්ව මුණගැහෙන්න ඕන කිව්වා"

"හ්ම්..."

"එතකොට තමයි මම ඔබට කෝල් එකක් ගත්තේ"

"ඊට පස්සේ?"

"ඊට පස්සේ මැඩම් කියපු විදියටම මම එයාව කැප්ටන් සාර්ස්ගේ කාමරයට යවන්න හැදුවා. ඒත් එයා ඒකට කැමති වුණේ නැහැ. එයා මොකක් හරි තැති ගැන්මකින් හිටියේ, ඒ නිසා කතා කළේ බොහෝම අඩුවෙන්. නැහැ මට ලොකු මැඩම්ව විතරයි මුණගැහෙන්න ඕන කියලා එයා ගිහින් ඉස්සරහා තිබුණ පුටුවෙන්

ඉඳ ගත්තා"

"හ්ම්.."

ලෝරා කල්පනා කළාය.

ජෝඩ් කියූ සෑම දෙයක්ම ඒ ආකාරයෙන්ම සීසීටීවී දර්ශන තුළ තැන්පත්ව ඇත. ඇය පොලිස් ස්ථානයට පැමිණි විගසම ජෝඩ් සමග යමක් කතා කළ බවත්, ඉන්පසුව ජෝඩ් දුරකථනය ඇමතුමක් ගෙන ඇයට කුමක් හෝ පවසන බවත් එහි සටහන් ව ඇත. ජෝඩ් සහ පොලිස් ස්ථානයට පැමිණි තරුණිය අතර සංවාදය තත්පර කිහිපයකට පමණක් සීමා වූ එකකි. ඒ නිසාම ජෝඩිගෙන් තවත් දැනගත යුතු දෙයක් නැතැයි තීරණය කළ ලෝරා, සිනහමුසු මුහුණින් යුක්තව ඇයට සමුදුන්නාය.

"හරි ජෝඩ් බොහෝම ස්තුතියි"

කී ඇය යළිත් විත් තම පුටුවට බර විය.

මෙහි කුමක් හෝ දෙයක් ඇත. ඇය පරිගණකයේ වූ සීසීටීවී දර්ශන දෙස බලාගෙන කල්පනා කළාය. තරුණිය පොලිස් ස්ථානයට පැමිණි හේතුව සොයා ගත හැක්කේ ඇයගෙන්ම පමණි. ඒත් ඒ සඳහා ඇයට සිහිය එන තුරු බලා සිටිය යුතුය. දැනටමත් රෝහලේ අධි සැත්කම් ඒකකයේ වාට්ටුවක සිහි විසඳව වැටී සිටින ඇයට යළි සිහිය එන්නේ කුමන මොහොතකදැයි දන්නේ 'උඩ ඉන්න දෙවියන්ම පමණි'. ඒත් එතෙක් පමා විය නොහැක. ඇය පසුපස හඹා යා යුතුය. ඇය පොලීසියට පැමිණි හේතුව කවරක් හෝ වේවා එය සොයා ගත යුතුය. ලෝරා එම මොහොතේම තවත් ඇමතුමක් ගත්තාය.

"එරික්.... අර කෙල්ල ගැන හෝඩුවාවක් ලැබුණද?"

ඇය ඇසුවාය.

"ඔව් ලෝරා... එයා යූටා විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්න කෙනෙක්... මම දැන් ඒ සේරම ඩොකියුමන්ට්ස් ඔයාට මේල් කළා"

එරික් එසේ පවසත්ම දුරකථනය විසංධි කළ ලෝරා තම

පරිගණයකයේ වූ විද්‍යුත් ලිපි ගොනුව විවර කළාය. එහි උඩින්ම එරික් විසින් එවූ ලිපි ගොනු සහිත ඊමේලය සටහන් වී ඇත. එය විවර කළ ලෝරා තම ආසනයට වඩාත් බරව ඉදගත්තාය.

'සමන්තා ඒකනායක'

'ශ්‍රී ලාංකීක'

යූටා විශ්ව විද්‍යාල හැඳුනුම් පතෙහි උඩින්ම සටහන් වී තිබුණි.



එරික් විසින් එවා තිබුණු ලිපි ගොනු අතර 'සමන්තා' නමින් හැඳින්වූ එම තරුණියගේ විශ්ව විද්‍යාල හැඳුනුම්පතත්, ඇමෙරිකානු පුරවැසි කාඩ්පතත්, ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයත් වූ අතර, ඇය මීට අවුරුදු පහකට පමණ පෙර ඇමෙරිකාවට සංක්‍රමණය වී ඇති බැව් එහි සඳහන් වී තිබුණි.

ලෝරා ඇයගේ ගුවන්ගමන් බලපත්‍රයේ වූ සෑම තොරතුරක්ම එකිනෙක පරීක්ෂා කරන්නට පටන් ගත්තාය. ඇය ඇමෙරිකාවට පැමිණ ඇත්තේ මීට අවුරුදු පහකට පෙර වුවත් ඇය එතැන් සිට මෙහි රැඳී සිට ඇත්තේ නීත විරෝධීවය. ඒත් කුමක් හෝ හේතුවකට මීට මාස කිහිපයකට පෙර ඇයට ඇමෙරිකාවේ නීත්‍යානුකූල පුරවැසි භාවය හිමි වී ඇත.

"මේකනම් වෙන්න බැරි දෙයක්"

ඒ දෙස බලා සිටියදීම ඇය මිමිණුවාය. නීතී විරෝධීව අවුරුදු කිහිපයක් ඇමෙරිකාව තුළ ජීවත් වූ කෙනෙකුට මීට මාස කිහිපයකට පෙර එක් වරම ඇමෙරිකානු පුරවැසි භාවයක් ලැබීම සැලකිය යුතු කරුණකි. ඇයගේ මුවින් සිහින් සිනහවක් නික්ම ආවාය. තමන් මේ පරීක්ෂණයේ සොයා ගත යුතු මුල්ම තුරුම්පුව සොයා ගත් බැව් ඇයට පසක් වී හමාරය. ඇය යළිත් එරික්ට ඇයමතුමක් ගත්තාය.

"එරික්... ඒ කෙල්ල පුරවැසි භාවයට අයදුම් කරපු ඩොකියුමන්ට්ස් තියෙනවද?"

ඇය ඇසුවාය.

"නැහැ ලෝරා... ඒ ගැන කිසිම තොරතුරක් නැහැ"

"ඒ කියන්නේ ඒක නීති විරෝධී එකක්"

"වෙන්න පුළුවන්... එහෙම නැත්නම් උඩින් ආපු එකක් වෙන්නත් පුළුවන්"

"උඩින්...?"

"ඔව්... රාජ්‍ය මට්ටමින්"

එය ඊටත් වඩා සැලකිය යුතු කරුණකි. ලෝරාගේ දෑස් කල්පනාවක ගිලී ගියාය.

"ඇමෙරිකාවට ආවට පස්සේ ඒ කෙල්ල ගැන වාර්තා තියෙනවද?"

ඇය යළිත් ඇයසීය.

"නැහැ ලෝරා.... කිසිම පොලිස් වාර්තාවක ඒ ගැන සටහනක් නැහැ.. ඒත්..."

කී එරික් මඳක් නතර විය.

"ඒත් මොකක්ද?"

"මම දැනටමත් ඒ තොරතුරු පරීක්ෂා කරන ගමන්, ඒ නිසා මට හරියටම තහවුරු කරන්න බැහැ. නමුත් මට හිතෙන විදියට ඇය රාත්‍රී සමාජ ශාලාවල සේවය කරපු තරුණියක්"

"හ්ම්..."

ලෝරා යළිත් මිමිණුවාය. රාත්‍රී සමාජ ශාලාවල සේවය කරන තරුණ කෙල්ලන් වේටර් වරියන් විය නොහැක.

"ගණිකාවක්..?"

ඇය යළිත් ඇසුවාය.

"වෙන්න පුළුවන්"

ඇයට එහා පසින් ඇසිණ. ඇමෙරිකාවට පැමිණ නීති විරෝධීව ජීවත් වූ ගණිකාවක් ලෙස රාත්‍රී සමාජ ශාලාවල සේවය කළ

කෙල්ලෙක් එක් වරම ඇමෙරිකානු පුරවැසි භාවයක් ලබා ගැනීම ලෝරාගේ සැකයට තුඩු දුන් ප්‍රධානම කරුණ විය. එසේ වීමට නම් එතැන කුමක් හෝ ප්‍රබල හේතුවක් තිබිය යුතුය. ඇය එම තොරතුරු පසුපස හඹා යාමේ වගකීම තම සගයා වූ එරික් රොබින්සන්ට පැවරුවාය. එම තරුණිය විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත් කාලය තුළ ජීවත් ව සිටි ස්ථානයත්, කළ කී දෑ සේම ඇය ආශ්‍රය කළ අයවලුන්වත් පරීක්ෂා කිරීම එරික් විසින් සිදු කරනු ඇත. ඒ කාලය තුළදී ඇයට ඇත්තේ තරුණිය රඳවා සිටින වාට්ටුවේ ආරක්ෂාව තර කිරීමයි. ඇය මිනීමැරුමකට සම්බන්ධ වී ඇත්නම් නිසැකවම සිහි ලත් විගස ඇය රෝහලෙන් පිටවී යාමට යන්ත දරනු ඇත. එසේ නැතහොත් කලින් මෙන්ම සියදිවි නසා ගැනීමට වෑයම් කරනු ඇත.

ලෝරා ඒ මොහොතෙම තවත් පොලිස් නිලධාරියෙකු සමග රෝහල බලා පිටත් වූවාය.

ඇය රෝහලට යන විටත් තරුණියගේ සැත්කම අවසන් වී ඇයව යළිත් වාට්ටුව වෙතට මාරු කොට තිබුණි. ලෝරා ඇයව රඳවා තිබුණු වාට්ටුව ඉදිරියට ගොස් හිටගත්තාය. එහි වීදුරු කවුළුවෙන් වාට්ටුව දෙස ටික වේලාවක් බලා සිටියාය.

ඇය ඉදිරියේ සිටින්නේ කාල වර්ණ සමකින් යුක්ත වූ කෙට්ටු ශරීරයක් ඇති තරුණියකි. ඇය ඒ මොහොතේ ඇඳ මත අප්‍රාණිකව වැටී ඇත. අනතුරින් සිදුවී ඇති තදබල හානිය නිසාවෙන් ඇයගේ හිස වටා වෙළුම් පටි බැඳ ඇති අතර ඇයගේ ශරීරයේ තැන් කිහිපයකින්ම බට දමා ඒවා ඇඳ අසල වූ විවිධ යන්ත්‍රයන්ට සවි කොට ඇත. ලෝරා ඇය දෙස සානුකම්පිතව බලා සිටියාය. ඇය කුමන ආකාරයේ මිනීමැරුමකට සම්බන්ධ වුවත් ඇයගේ ජීවිතය දැන් ඇත්තේ දෙවියන් අතේය. දෙවියන්ගේ කැමැත්තත් අකමැත්තත් මත ඉදිරියේදී සිදුවන සියලුම දේ සිදුවණු ඇත.

නමුත්... ඇයට සිහි පැමිණි විට ඇය නිතැතින්ම කෝපයට පත් වනු ඇත. තම ජීවිතය බේරා ගත් දෙවියන්ට පවා ඇය ශාප කරනු

ඇත. ඒ සියල්ල ගැන සිතමින් එතැන ටික වේලාවක් හිටගෙන සිටි ලෝරා තමා අසන්නයේම සිටි පොලිස් නිලධාරියා දෙස බැලුවාය.

"රෙක්ස් ඔයා මෙතැන නවතින්න. ඇයට මොනම මොහොතක හරි සිහිය එන්න පුළුවන්. ඇයට සිහිය ආ විගසම මට ඒ ගැන දන්වන්න"

ඇය ඔහුට කීවාය.

"හරි මැඩම්"

කී රෙක්ස් වාට්ටුව ඉදිරියේම වූ පුටු පේළියේ තරුණියව පේන මානයේම ඉඳගත්තේය.

ලෝරාද අඩ හෝරාවක් පමණ වාට්ටුව අසලම හිටගෙන සිටියාය. ඒ අතර ඇය වාට්ටුවේ සිටි හෙදියන් සමග ලෝරාගේ තත්වය ගැනත්, ඇයගේ ඉදිරි ප්‍රතිකාර ගැනත් කතා කළාය. අවසානයේදී යළිත් තම රාජකාරී ස්ථානය කරා යා යුතු වූ විට ඇය හෙදියන්ටත්, රෙක්ස්ටත් සමුදී එතැනින් එන්නට හැරුණාය. ඒ අතර ඇයගේ දෑස් යළිත් තරුණිය දෙසට හැරිණ.

"ඇයට දැන් මිය යා නොහැක... ඇය කළ අපරාධය කුමක් වුවත් ඇය ජීවිතය පුරාවටම එයත් සමග ජීවත් වනු ඇත"



එදින රාත්‍රිය ලෝරාට පහසු එකක් නොවීය. උදෑසනම සිදුවූ අනතුරත්, රෝහල් ගත කළ තරුණිය විසින් පැවසූ 'මිනීමැරුමත්' ඇයගේ මනස කළඹමින් තිබුණි. ඒ නිසාම ඇයට රාත්‍රියේ නින්ද ගියේ නැත. හෝරා කිහිපයක්ම ඇඳට වී කල්පනා කරමින් සිටි ඇය අලුයම වෙද්දී දෑස් වසා ගත්තාය. ඒත් එයත් ස්වල්ප වේලාවකට පමණි. ඇයගේ ජංගම දුරකථනයට පැමිණි ඇමතුමකින් ඇය යළිත් අවදි විය.

"මැඩම් .... අර කෙල්ලට සිහිය ආවා"

එය ඇයසෙත්ම ලෝරා ඇඳෙන් නැගිට ගත්තාය. තවත් ප්‍රමාද විය නොහැක. හැකි ඉක්මනින්ම රෝහලට යා යුතුය.

ඇය එම මොහොතේම ක්‍රියාත්මක වූවාය. තම නිල ඇඳුමත් ඒ උඩින් දමා ගත් කබායකිනුත් සැරසුණු ඇය හැකි ඉක්මනින්ම රෝහලට යාමට පිටත් වූවාය.

♡

වේලාව උදෑසන හයට ආසන්නව තිබුණි. උදෑසන සූර්යාලෝකය රෝහල් පරිශ්‍රය සිප ගනිමින් ඇත. මෙය ප්‍රෝවෝ නගරයේ තිබුණු ප්‍රධාන රෝහල වූ බැවින් එය නිරන්තර කාර්යබහුලත්වයකින් පිරී ගියේය. රෝහල ඉදිරියේ කාරය නැවැත්වූ ලෝරා තරුණියව නවතා තිබුණු වාට්ටු සංකීර්ණය වෙතට දිව එන්නට විය.

දරුණු අනතුරකින් පසුව සිහි පැමිණි කාන්තාවක් සමග ප්‍රශ්න කිරීම ඉතාමත් සීරුවෙන් කළ යුතු කටයුත්තකි. බොහෝ විට වෛද්‍ය වරුන් මෙවැනි ප්‍රශ්න කිරීම් සඳහා ඉඩ නොදෙන අතර එය අධිකරණ නියෝගයක් හරහා සිදු කළ යුතු වෙයි. ඒ නිසාම ලෝරා මෙහිදී වඩාත් ආරක්ෂාකාරී විය. ඇය මුලින්ම වාට්ටුවට ගියේ නැත.

ඒ වෙනුවට රෝහලේ ප්‍රධාන වෛද්‍යවරයාව හමුවූ ඇය, සමන්තා නමින් හැඳින්වූ ඒ තරුණිය සිය දිවි නසා ගැනීමට තැත් කළා සේම ඇය කුමක් හෝ මිනීමැරුමකට සම්බන්ධ බවත්, ඒ ගැන මෙතෙක් කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි වූයෙන් එය දැනගත හැක්කේ ඇයගෙන්ම පමණක් බවත් පවසා ඒ සඳහා ප්‍රශ්න කිරීමට ඉතාමත්ම කෙටි කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය.

"මිනීමැරුමක්?"

වෛද්‍යවරයා ඇයගෙන් යළිත් ඇයසුවේය.

"ඔව් ඩොක්ටර්, ඒත් අපිට තවමත් ඒ ගැන හරියට කියන්න බැහැ" ලෝරා කීවාය.

ඝාතනයක් සම්බන්ධ පරීක්ෂණයක් නම් රෝගියාගේ තත්වය තවත් දරුණු වීමට පෙර ඒ ගැන ප්‍රශ්න කිරීමට ඉඩ දිය යුතුය. වෛද්‍යවරයා ඒ නිසාම එයට කැමැත්ත පළ කළේය.

"තව විශේෂ කරුණක් තියෙනවා"

ඔහු කීවේය.

"ඇය මේ මොහොතේ ඉන්න තත්වෙත් එක්ක ඇයත් එක්ක වැඩි පුර කතා කරන්න එපා. ඒ වගේම ඇයගේ හිසට තදබල ලෙස තුවාල වෙලා තියෙන්නේ, තව පැය තුනකින් ඇයට තවත් සැත්කමක් කරන්න තියෙනවා. ඒක කලින් එකට වඩා සංකීර්ණ එකක්, ඒ සැත්කමෙන් ඇයගේ ජීවිතයට පවා හානියක් සිදුවෙන්න පුළුවන්. ඒ නිසා අපිට සිද්ධ වෙනවා ඇයගෙන් හෝ පවුලේ කාගෙන් හරි සැත්කමට අවසර ගන්න."

කී වෛද්‍යවරයා මේසය මත වූ ෆයිල් කවරයක් ලෝරා ඉදිරියේ තැබීය. ලෝරා එය ඇයගේ අතට ගත්තාය.

"සමන්තාට දැන් සිහිය ඇවිත් නිසා අපිට ඇයගෙන්ම සැත්කමට අවසර ගන්නත් පුළුවන් වෙයි"

ලෝරා වෛද්‍යවරයාට අතට අත දී තම ආසනයෙන් නැගී සිටියාය.

ඇයට ඇත්තේ සීමිත කාලයකි. මේ කාලය තුළ එම තරුණියගේ පවුලේ අය ගැනත්, ඇය කළ මිනීමැරුම ගැනත් සියලුම දේ දැනගත යුතුය. ඇය ඉක්මන් කළාය. වෛද්‍යවරයාට සමුදුන් ඇය සමන්තාව නවතා තිබුණු කාමරය කරා ඇයවිද යන්නට විය.

ඇය එතැනට යද්දී රෙක්ස් නමින් ඇය හැඳින්වූ 'රෙක්ස් පාලෝ' නම් පොලිස් සාර්ජන්වරයා ඔහු ඉඳ සිටි ආසනයෙන් නැගිට ඇය වෙතට ආවාය.

"මැඩම් දැන් ටිකකට කලින් තමයි කෙල්ලට සිහිය ආවේ, මම ඒ වෙලාවෙමයි ඔබට කෝල් එකක් ගත්තේ"

"බොහෝම හොඳයි රෙක්ස් "

ලෝරා කීවාය. ඒත් සමගම දොරට තට්ටුවක් දැමූ ඇය කාමරය තුළට ගියාය. මෙය සුදු පැහැ තීන්තෙන් කරන ලද සාමාන්‍ය

ප්‍රමාණයේ කාමරයකි. එහි හරි මැදට වෙන්නට රෝගියාව රඳවා තිබුණු ඇඳත්, ඒ වටා යන්ත්‍ර කිහිපයකුත්, පැත්තක අල්මාරියක් සහ වැසිකිළියකුත් විය.

කාමරයට පැමිණි ලෝරා තරුණිය දෙස බලාගෙනම ඇය අසලට ආවාය. ඒත් ඇඳෙහි සිටි තරුණිය ලෝරා දෙස බැලුවේ නැත. ඇයගේ දෑස් එක එල්ලේම වාට්ටුවේ සිවිලිමට රැඳී තිබුණි. ඇය අසල හිටගෙන සිටි හෙදියක් ලෝරාගේ පැමිණීමත් සමගම ලෝරා ළඟට පැමිණියාය.

"එයා සිහිය ආපු හැටියම අඬන්න පටන් ගත්තා. තවමත් කම්පනයෙන් ඉන්නේ, ඒ නිසා වැඩි වෙලාවක් කතා කරන්න එපා"

කී ඇය ලෝරාට ඇයගේ රාජකාරිය කරන්නට ඉඩ දී වාට්ටුව ඉදිරියේ වූ ලාන්ස් ඉඳගෙන සිටි පුටු පේළියේම ඉඳගත්තාය.

ලෝරා සමන්තා අසලට නැඹුරු විය.

"සමන්තා.."

ඇය තරුණියට ආමන්ත්‍රණය කළාය. එම නම ලෝරාගේ කටින් පිටවෙත්ම ලෝරා දෙස බැලූ තරුණිය අඬන්නට පටන් ගත්තාය. ඒ අඬන ගමන් ඇය කුමක් හෝ මුමුණන්නට වූ අතර එම වචන ඇයගේ කටින් පිට වූයේ නැත. ඇය සිටින්නේ දැඩි වේදනාවකින් බැව් තේරුම් ගත් ලෝරා සමන්තා අසලටම නැඹුරු වී ඇයගේ අතක් අල්ලාගත්තාය.

"සමන්තා... ඔයාගේ තත්වය තවමත් හොඳ නැහැ. ඒ නිසා ඔයා සංසුන් වෙන්න ඕන"

ඇය සමන්තාගේ අත සෙමෙන් පිරිමදින ගමන් කීවාය. ඒත් සමන්තාට ඇයගේ ඇඬීම පාලනය කර ගැනීමට හැකි වූයේ නැත. ටික මොහොතකින්ම එම ඇඬුම කෙඳිරුම් හඬක් සමග නැගී ආ 'දරුණු වේදනාවකින්, කකියන හදවතක් ඇත්තියකගේ' ඇඬිල්ලක් බවට පත් විය. ලෝරා ශෝකයෙන් වෙළී ගිය මුහුණින් යුක්තව ඇය සන්සුන් වන තුරු නිහඬව බලා සිටියාය. ඉන්පසුව ඇය එතැන වූ පුටුවක් ගෙන සමන්තා ළඟට විත් ඇයට වඩාත්

නැඹුරුව ඉඳගත්තාය.

සමන්තාට ඇත්තේ කාල වර්ණ දෙනෙතකි. අනතුර නිසාවෙන් ඇයගේ එක් ඇසක් අනෙකට වඩා ඉදිමී තිබුණු අතර එය දැඩි ලෙස රත් පැහැ වී ඇත. ඇයගේ මුහුණ දිගු මුත් රවුම් මුහුණකි. ඉන්දියානු කාන්තාවන්ගේ මෙන් ප්‍රමාණයෙන් කුඩා නාසයකුත් පළල් දෙතොලකිනුත් ඇය යුක්ත වූවාය.

ලෝරා වෛද්‍යවරයා විසින් දුන් ෆයිල් කවරය ඇය ඉදිරියේ දිග ඇරියාය.

"සමන්තා ඔයාට තවත් සැත්කමක් කරන්න තියෙනවා. ඒකට ඔයාගේ අවසරය ඕන"

කී ඇය එයින් ගත් ලියවිල්ලක් සමන්තාට පෙනෙන සේ අල්ලාගෙන සිටියාය. සමන්තා එය කියවීමටවත් ඒ දෙස බැලීමටවත් වෑයම් කළේ නැත. ඒ වෙනුවට ඇය ඉවත බලාගෙන පෙර සේම අඬන්නට වූවාය.

ඒත් මේ ඇය එයට අත්සන් කළ යුතු මොහොතයි. වෛද්‍ය වරයා පැවසූ ආකාරයට එය තීරණාත්මක සැත්කමක් නම් එය නොකළහොත් එයින් ඇයගේ ජීවිතය පවා නැතිවීමට ඉඩ ඇත.

"සමන්තා මේ සැත්කම නොකළොත් ඔයාගේ ජීවිතය අනතුරේ වැටෙන්න පුළුවන්"

ලෝරා තම සාක්කුවෙන් ගත් පෑනක් ගෙන එය සමන්තා දෙසට දිගු කළාය. ඒත් සමගම සමන්තාගේ දෑස් ලෝරා වෙත ඇදින. ඇය පෙර සිටි පශ්චාත්තාපයට වඩා මෙවර ඇයගේ දෑසේ ඇත්තේ තදබල කෝපයකි.

"ඇයි මාව බේරගත්තේ? ඇයි.... ඇයි...?"

ඇය වාට්ටුව දෙදරන්න තරම් වූ හඬකින් කෑ ගැසීය. ඒ මොහොතේ වාට්ටුවෙන් එළියේ සිටි හෙදිය යළිත් කාමරයට ඒමට තැත් කළෙන් පිටු පස හැරී ඇය දෙස බැලූ ලෝරා ඇයට නවතින්නැයි අතින් සන් කළෙන් ඇය එතැනම හිටගත්තාය.

"සමන්තා... කාවද ඔයා මැරුවේ?"

ලෝරාගේ මුවින් එම ප්‍රශ්නය තියුණු හඬකින් එළියට අවාය. මෙවන් මොහොතක එය ඇසිය යුතු ප්‍රශ්නයක් නොවීය. එය ලෝරා හොඳාකාරවම දැනගෙන සිටියාය. ඒත් සමන්තාගේ අවධානය වෙනතකට යොමු කිරීමටනම් ඇය කුමක් හෝ කළ යුතුව තිබුණි. ඒ නිසාම මෙම ප්‍රශ්නය ලෝරාගේ මුවින් ගිළිහෙන්නට ඇත.

ඇය සිතූ ආකාරයටම එම ප්‍රශ්නයත් සමග සමන්තාගේ ඇඬිල්ල නවතින බවත්, ඇය ආයාසයකින් කල්පනා කරන බවත් පෙනෙන්නට විය. ඉන්පසුව ඇයගේ දෑස් එක් වරම ලෝරා දෙසට හැරිණ. ඒ දෑස් වල ඇත්තේ කලින් වූ වේදනාව නොව ප්‍රබෝධයකි, සතුටකි, එතනිනුත් එහාට ගිය අමුතුම ප්‍රීතීමත් හැඟීමකි. ඇය සිනාසුණේ නැත.

ඒත් ඒ ප්‍රීතිය ඇයගේ දෙනෙත් වලින් මනාව පෙනෙන්නට පටන් ගත්තාය. මේ මොහොතේ ලෝරා ඇයගේ දෙනෙත් වලට එබී බලන්නාක් මෙන් යළිත් එම ප්‍රශ්නයම ඇසුවාය.

"සමන්තා... ඔයා කාවද මැරුවේ...?"

"ඔව් මම මැරුවා"

සමන්තා කොඳුරන්නට පටන් ගත්තාය.

"මම මැරුවා. උණ්ඩ තුනක්ම බස්සලා මරලම දැම්මා"

ඇය එක දිගටම කියෙව්වාය. ඇයගේ දෑස් ඒ ප්‍රබෝධයත් සමග විශාල වන අයුරුද, ඇයගේ දෙතොල් වඩාත් ප්‍රාණවත් වන අයුරුද ලෝරා දුටුවාය.

"කාවද මැරුවේ...?"

ලෝරා ඒ මොහොතේම යළි යළිත් කිහිප වාරයක්ම ප්‍රශ්න කළාය. ඒත් ඇය එම ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නාක් මෙන් අහක බලාගත්තාය.

"සමන්තා ඔයා කාව හරි මැරුවනම් ඒ ගැන කියන්න හොඳම වෙලාව මේක. ඒ නිසා කරුණාකර මට කියන්න කාවද ඔයා මැරුවේ, ඇයි මැරුවේ, කොහේද කොහොමද? මේ හැමදෙයක්ම මට දැනගන්න ඕන"

ඒත් සමන්තා එයට පිළිතුරු දුන්නේ නැත. ඇය එය හිතා මතාම ප්‍රතික්ෂේප කරන බැව් ලෝරාට වැටහුණාය. ඒ නිසාම තම අතේ වූ ෆයිල් කවරය පැත්තකින් දැමූ ලෝරා ඇයගේ ඉවත බලා සිටි දෑස් අසලට වඩාත් නැඹුරු විය.

තරුණිය සිහි විකලෙන් කිහිප වාරයක්ම දෙඩවූ ඒ නම ඇයට මතකය. එම නම ඇයගේ සිතින් ඉවත් වන්නේ නැත. ඊයේ රාත්‍රිය පුරාමත් ඇය සිතමින් සිටියේ එම නම ගැනය. සමන්තා පැවසූ මිනීමැරුමත්, මෙම නමත් අතර කුමක් හෝ සම්බන්ධතාවයක් ඇතුවාක් විය යුතුය. ලෝරා එය ඉවෙන් මෙන් දැන සිටියාය. ඒ නිසාම සමන්තා තම ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ මේ මොහොතේ ඇය එම නම තම මුවින් පිට කළාය.

"කාවද ඔයා මැරුවේ, ෆෙලී වද?"

එම නම ලෝරාගේ කටින් පිටවෙත්ම සමන්තාගේ දෑස් යළිත් ලෝරා වෙතට යාවිය. කලින් කෝපයෙනුත් ප්‍රබෝධයෙනුත් පිනා ගිය එම දෑස් එක් වරම කඳුළින් පිරී යන්නට වූවාය.

"ෆෙලී"

ඇය ලෝරා පැවසූ එම නම යළිත් මිමිණුවාය. ඒ මිමිණුමත් සමග ඇයගේ දෑස් වලින් ගරා ආ කඳුළු ඇයටවත් උසුලා ගත නොහැකි විය. ඇය වේගයෙන් හුස්ම ගත්තාය. ඇයගේ කටහඬ පවා එයින් දියාරුව ගියෙන් ඇය පිට කළා වූ වචන සිහින් කෙඳිරියක් බවටම පත් විය.

"ෆෙලී... "

ඇය ඒ නම යළිත් පිට කළාය.

"ඔව් ෆෙලී..."

ලෝරා යළිත් කීවාය. සමන්තා ටික මොහොතක් ලෝරා දෙස බලා ගෙන සිටියාය. ඇයගේ දෑස් තුළ වූ කඳුළු එක පේළියට කම්මුල් හරහා කඩා වැටෙන්නට විය.

"නැහැ, එයා ෆෙලී නෙමෙයි, එයා වීනස්"

ඇය කීවාය.

"එයා ඔයා වගේ... එයාට තිබුණෙත් නිල්පාට ඇස් දෙකක්... රත්තරන් පාට කොණ්ඩයක්"

සමන්තා එම වචන කිහිපය පිට කළේ හැඟීම් බරවය, ඇයගේ මුවින් සිහින් කෙඳිරිල්ලක් මෙන් වේදනාවෙන් පිටවූ එම වචන කිහිපය නිසාවෙන් ලෝරාගේ හදවත එයින් දරීද්‍රව ගියාය.

"ඉතින් කෝ දැන් වීනස්?"

ලෝරා සමන්තා අසලට ළංවී ඇසුවාය.

THRITHWA SERIES

# 02

**සතුට** කියන්නේ මොකක්ද කියලා ඇහැව්වොත් මට කියන්න තියෙන්නේ,

"මම ඒක හරියටම දන්නේ නැහැ"

සරණාගාතයෙක් විදියට ඇමෙරිකාවට ආපු දවසේ ඉඳන් අද වෙනකන්ම ඒක එහෙමයි. ලංකාවේ හිටිය කාලේ මට මුදල්, යාන වාහන මුකුත්ම තිබ්බේ නැහැ. ඒත් හිත පිරෙන්න සතුට තිබුණා.

අද ඒ සතුටත් මගේ ජීවිතයෙන් යන්නම ගිහින්.

ඒත් දුක.....

දුක මගේ ජීවිතේම කොටසක් වගේ හැමදාමත් මගේ ළඟම රැඳිලා.

මේ මොහොතෙත් ඒක එහෙමමයි..!

"පහත් වෙන්න සමන්තා"

ඩැරෙක් මගේ බෙල්ලෙන් අල්ලලා පහත් කරන ගමන් මගේ කනට කරලා කොඳුරනවා. එයා බෙල්ලෙන් අල්ලගෙන ඉන්න විදියට එයාගේ නියපොතු වලින් මගේ සම සිදුරු වෙලා යන්න තරම් වේදනයි.

ඒත් මොනවා කරන්නද මම එයාට අවනත වෙන්න ඕන.

එහෙම නැතිවුණොත් මම බලාපොරොත්තුවෙන් ඉන්න හැමදේම විනාශ වෙලා යනවා.

මට ඕන කොහොම හරි යූටා කැම්පස් එකට ඇතුළු වෙන්න. මේ හැමදේම ඒ වෙනුවෙන්.

මම හීන් සීරුවේ මේසයට පහත් වුණා. මේක පළල් මේසයක්. මම පහත් වෙද්දි ඩැරෙක් එයාගේ එක අතකින් මගේ බෙල්ල අල්ලලා මේසයට තද කළා, අනිත් අතින් මගේ සාය ගලවලා පහතට දැම්මා. ටික වෙලාවක් එයා ඒ විදියටම මගේ බෙල්ලෙන් අල්ලගෙන හිටියා. තදින්, ගොඩක් තදින්. හරියට මගේ බෙල්ල මිරිකළා දාන්න වගේ.

මේසයට මගේ කම්මුල සම්පූර්ණයෙන්ම තදවෙලා. හුස්ම ගන්නවත් බැරි තරමට, මම වේදනාව ඉවසගන්න බැරිව මේසයට අත් දෙකෙන්ම පහර දෙන්න ගත්තා.

ඒත් එක්කම එයා අත බුරුල් කළා. බුරුල් කරල කාමරයේ එක පැත්තකින් තියෙන දිගු බිත්තිය ඉස්සරහට ගිහින් හිටගත්තා.

මේ බිත්තියේ එක දිගට එල්ලලා තියෙන්නේ එයා මේ වගේ වෙලාවල් වලට පාවිච්චි කරන දේවල්. මාංචු, රබර් වලින් හදාපු වේවැල්, කස, රබර් පුරුෂ ලිංග, මේ හැමදෙයක්ම එක දිගට එල්ලලා තියෙනවා.

ඩැරෙක්ගේ ග්‍රහණයෙන් මගේ බෙල්ල නිදහස් වුණාට පස්සේ මම ආයෙමත් හුස්ම ගන්න පටන් ගත්තා. මට පුළුවන් තරම් වාතය අරගෙන මගේ පෙනහළු වල පුරවගත්තා. තව ටිකකින් එයා ආයෙමත් එහෙම කළොත්?

ඒත්..., මම තවමත් ඉන්නේ ඒ විදියටමයි, ඩැරෙක් ඒ සේරම කරලා ඉවර වෙනකන්ම මම ඉන්න ඕන එහෙම. මම පොඩ්ඩක්වත් හෙලවුණොත් එයා මීටත් වඩා දරුණු වෙන්න ගන්නවා. ඒ නිසා මම ඒ විදියටම හිටියා. මගේ හුස්ම ටිකෙන් ටික වේගවත් වුණා, මගේ හදවතත් ගැහෙන්න පටන් ගත්තා.

ගිය සතියේ එයා ගහපු වේවැල් පහරවල් තවමත් මගේ පිටේ තියෙනවා. ඒවා තවමත් හොඳටම සනීප වෙලා නැහැ. දෙවියනේ...

එයා ඒවටම ගැහුවොත් ඒවා තවත් ඇතුළට කැපිලා යයි. ඒත් මම කොහොමද එයාව නවත්වන්නේ. ඒක කරන්න බැහැ. මම ඉවසනවා. පුළුවන් තරම් ඉවසනවා. මගේ ශරීරයෙන් ලේ ආවත්, හම පසාරු කරගෙන ගියත් මම දත් මිටි කාගෙන හරි ඉවසගෙන ඉන්නවා. මට ඕනේ කොහොම හරි යූටා විශ්ව විද්‍යාලයට යන්න. වීසා නැතිව, ඇමෙරිකාවේ හිරවෙච්ච මට, වීසා හදාගෙන කැම්පස් එකටත් යන්න ලැබෙනවනම් ඒක හාස්කමක්, ඒ හාස්කම පෙන්නන්න පුළුවන් ඩැරෙක්ට විතරයි.

මේ හැමදේම ඉවරවුණාම මට පොරොන්දු වුණ විදියටම එයා කැම්පස් එකට කෝල් එකක් ගනියි. එයාගේ සම්බන්ධකම් හරහා මට වීසා හදලා දෙයි. එයා මෙහේ ප්‍රභල කෙනෙක්, මොකක් හරි ලොකු නිලයක් දරන කෙනෙක්. මේ රටේ එයාට කරන්න බැරි දෙයක් නැහැ.

ඕන දෙයක් වුණාදෙන් කියලා මම ඇස් දෙක වහගත්තා.

ඒත් එක්කම මට ඇහුණා ඩැරෙක් වේවැල් කිහිපයක් අතට අරගෙන ඒවා ගසලා බලනවා.

**(එයා තෝරගන්න වේවැලේ ප්‍රමාණය තීරණය වෙන්නේ එයා ඉන්න මූඩ් එක මත. එයාගේ රාජකාරිත් එක්ක එයා ඉන්නේ දැඩි පීඩනයකින් නම් එයා තෝරගන්නේ ගොඩක් හීනි එක. ඒකෙන් ගහද්දි හම පැලිලා යනවා. මගේ විලාපය වැඩිවෙනවා. සමහර වෙලාවට රුධිරයත් විසිවෙන්න ගන්නවා. එයා තරහව, වෛරය, පීඩනය, ඒ හැමදේම ඒ විදියට පිට කරනවා.)**

මම එයාගේ හැම පියවරක්ම අහගෙන හිටියා. හරියට, ගොදුරක් විදියට අහුවෙච්ච මුව පොව්වෙක් තමන්ව මැරිලා යන මොහොත වෙනකන් භීතියෙන් ගැහි ගැහී ඉන්නවා වගේ.

එයාගේ සපත්තු වල අඩි සද්දේ ටික වෙලාවකින් මගේ ඉස්සරහින් ඇහෙන්න ගත්තා. මම ඇස් ඇරලා ඒ පැත්ත බැලුවා. මම දැක්කා එයා කාමරයේ තියෙන විදුලි බල්බයේ ආලෝකය අඩු කරනවා. මේක සමචතුරශ්‍රාකාර විශාල කාමරයක්. එයා මේ කාමරය හදලා තියෙන්නේ සෙක්ස් වලටම විතරක් වෙන්න ඕන. කාමරයේ තියෙන හැමදේම ලිංගික තෘප්තියට පාවිච්චි කරන

දේවල්.

මේ මම, මේ කාමරයට ආපු දෙවැනි වතාව. පළවෙනි වතාවට මම ආවේ ඩොලර් පන්සීයකට.

කාත් කවුරුත් නැතිව ඇමෙරිකාවේ තනිවෙච්ච කෙල්ලෙක්ට ඩොලර් පන්සීයක් කියන්නේ ලොකු දෙයක්. මාසෙට කාමර කුලිය දෙසිය පනහයි, අනිත් ටික යාන්තමට හරි කාලා බීලා ජීවත් වෙන්න. ඒත් මේ වතාවේ මම ආයෙමත් එන්න කැමති වුණේ, මගේ හීනය වෙනුවෙන්. ළිඳට වැටිච්ච එකා ළිං කටින්ම ගොඩ එනවා වගේ, මට වෙන විකල්පයක් නැහැ.

ඩැරෙක් කාමරයේ විදුලි බල්බය අඩු කරලා වෙනින් විදුලි බල්බයක් පත්තු කළා. ඒක රතුම රතු පාට එකක්. කලින් එකේ සුදු පාට, මේ ආලෝකයත් එක්ක නැත්තටම නැතිවෙලා ගිහින් මුළු කාමරයම රක්ත වර්ණ ආලෝකයකින් පිරිලා ගියා. එයාගේ අතේ තිබුණේ හීනි වේවැලක්. එයා ඒ වේවැලත් ගස ගසා මගේ ළඟට එන්න පටන් ගත්තා. මගේ මුළු ශරීරයම වෙවුලුවා. හදවත තවත් හයියෙන් ගැහෙන්න පටන් ගත්තා.

"සමන්තා, ඉවසපන්.... ඉවසපන්. උඹ වීසා නැතිව අනාථයෙක් වෙච්ච කෙල්ලෙක්. මේ තමයි උඹේ හාස්කම. ඒක දරුණු හාස්කමක්. වේදනාකාරී හාස්කමක්, ඒත් උඹ ඒකට මුහුණ දෙන්න ඕන. එහෙම නැතිවුණොත් උඹට වෙන්නේ ඇමෙරිකාවේ හිඟා කන්න. උඹ දන්නවනේ, මුන් හේතුවක් නැතිව කිසිම උදව්වක් කරන්නේ නැහැ. උඹට වෙන්නේ මෙහෙම මැරිලා යන්න. අන්ත අසරණ හිඟන්නෙක් වගේ මේ රටේම වැළලෙන්න. ඉතින් හිතපන්, ඊටත් වැඩිය මේක හොඳ නැද්ද?"

මම හිතට ධෛර්යය ගත්තා.

"මේක හොඳයි, මේක හොඳයි... මට වේදනාව ඉවසන්න පුළුවන්".

මම ආයෙමත් ඇස් දෙක වහගත්තා.

ඩැරෙක් මගේ ළඟට ඇවිත් මේසය දෙපැත්තට සවි කරලා තිබුණ මාංචු දෙකක් මගේ අත් වලට දැම්මා. මගේ අත් දෙක

මේසෙන් අහකට ගන්න බැරි වෙන්න. ඒත් එක්කම එයා මගේ කනට කරලා කෙදිරුවා.

"සමන්තා, මේක ඉක්මනට ඉවර වෙයි.."

එච්චරයි.

ඊට පස්සේ.....

එයා මගේ පැන්ටිය ගලවලා බිමට දැම්මා.

එතැනින් එහාට .....

එයා වියරුවෙන් වගේ මට ගහන්න පටන් ගත්තා. මගේ තට්ටමත්, පිටත් පැලිලා යන්නම එයා මට ගැහැව්වා. මම කෑ ගැහැව්වා. ඇඬුවා, විලාප දුන්නා. ඒ වේවැල් පහරවල් මගේ හම ඇතුළට කිඳා බහිද්දි ඒ වේදනාවෙන් සිහිසුන් වෙන තරමටම මම කෑගැහැව්වා.

ඒත් ඒ සේරම ඩැරෙක්ට ආස්වාදයක් වෙන්න ඇති. අන්තිමට මට වේදනාව ඉවසගන්නම බැරි වෙද්දි මම මාංචු ගැලවෙන තරම් වේගයකින් අත් දෙකින්ම මේසයට ගැහැව්වා... විනාඩි පහළොවක්ම එක දිගට... අනේ දෙවියනේ! ජීවත් වෙන්න කියලා මෙහෙම වේදනාවක් කොහොම ඉවසන්නද?

අන්තිමේදී, ඩැරෙක් වේවැලෙන් පහර දීම නැවැත්තුවා. මගේ කොණ්ඩෙන් ඇදලා අරන් එයාගේ එක අතකින් මගේ තට්ටමට වේගයෙන් පහර දෙන්න ගත්තා.

අන්තිමට ඒකත් ඇතිවුණාට පස්සේ එයා ගිහින් මේසය පිටුපස්සේ තිබුණ පුටුවේ ඉඳගත්තා.

කාමරය මගේ විලාප හඬින් තවමත් දෝංකාර දෙනවා. මම ඇඬුවා. වේදනාව පිටවෙලා යනකන්ම ඇඬුවා.

ඒත් එක්කම මට ඇහුණා ඩැරෙක් වේගයෙන් හුස්ම ගන්නවා. මගේ විලාපය යටින් සෝපාවේ කිරි කිරියත් ඇහෙනවා. එයා පිටුපස්සේ සෝපාවේ ඉඳගෙන ඒක කරනවා ඇති. ගිය සතියෙත් මට පහර දීලා ඉවර වෙලා එයා ඒක කරලා කාමරයෙන් පිටවෙලා යන්න ගියා.

අදත් එහෙම වෙයි.

මේ සේරම ඉක්මනින්ම ඉවර වෙයි.

මට තේරෙනවා මගේ ඇඟෙන් ලේ ගලනවා..

ඒත් මම සංසුන් වුණා. ඒක ඉවරයි...

ඒක ඉවරයි සමන්තා.. ඒක ඉවරයි.

ඒත්... මට තවත් හිටගෙන ඉන්න තරම් ශක්තියක් තිබුණේ නැහැ. මාව එතැනම බිමට ඇදන් වැටුණා.

මට මතක එච්චරයි. එතැනින් පස්සේ මට මොනවා වුණාද, ඩැරෙක් මොනවා කළාද ඒ කිසිම දෙයක් මම දන්නේ නැහැ. මම ආයෙමත් නැගිටිද්දි මම හිටියේ ඩැරෙක්ගේ මන්දිරයේ ගෙස්ට් රූම් එකක.

මම යාන්තමට ඇස් ඇරලා වටපිට බැලුවා. කාමරයේ ජනෙල් වලින් හිරු එළිය ඇතුළට වැටිලා. ඒවා මගේ ඇඟ දිගේ ගලාගෙන යනවා. මම ලොකු හුස්මක් එක්ක ඇඳේ ඉඳගත්තා. ඒක විශාල නිදන කාමරයක්. සුදුම සුදු පාට සුඛෝපභෝගී එකක්.

"මට මොකක්ද වුණේ, මම කොහොමද මෙතැනට ආවේ?"

ඒ සිතුවිලිත් එක්කම මම ඇඳේ පොරෝනය විසික් කරලා ඇඳෙන් බහින්න හැදුවා.

"දෙවියනේ...!"

සුදු පාට පොරෝනය පුරාම ලේ...

මම හිටියේ නිරුවතින්...

සම්පූර්ණයෙන්ම නිරුවතින්...

ඇඳෙන් බහින්න බැලුවත් කකුල් දෙක බිමින් තියන්න බැරි තරමටම මුළු ශරීරයම වේදනායි. වේවැල් පහරවල් වලට මගේ තට්ටමත් පිටත් කැපිලා යන්න ඇති. ඒත් ඒ මිනිහා කිසිම හිතක්

පපුවක් නැතිව මාව මේ ඇඳ උඩට අත හැරලා යන්න ඇති.

එහෙම තමයි, සල්ලි කාරයොන්ට අපි වගේ අසරණ කෙල්ලන්ව නිකන්ම නිකන් සෙල්ලම් බඩුවක් විතරයි.

වේදනාව යන්නත් එක්ක මම ටික වෙලාවක් ඇඳේ ඉඳගෙන හිටියා. මගේ පස්ස ඇඳට තියාගෙන ඉඳගන්නවත් බැරිවෙන තරමටම කැක්කුමයි. ඒත් එක්කම මට ඇහුණා මගේ දුරකථනය නාද වෙනවා.

මම වටපිට බැලුවා. ඇඳ ළඟම එක පැත්තක තියෙනවා කන්නාඩි මේසයක්. ඒ කන්නාඩි මේසය උඩ මගේ ඇඳුම් ටිකයි, මගේ බෑග් එකයි තියලා තියෙනවා. දුරකථනය ඇත්තේ මගේ බෑග් එකේ. මම එතැනට දුවලා ගියා.

දුරකථන තිරයේ ලියලා තියෙන්නේ 'නොහඳුනන නොම්මරයක්' කියලා.

"හෙලෝ"

මම කතා කළා.

"හෙලෝ සමන්තා"

ඒකෙන් ආවේ ගැඹුරු හඬක්. මම ඒ කටහඬ හඳුන ගත්තා, ඒ ඩැරෙක්...

"ඩැරෙක්"

"සමන්තා, ඔයාට ඕන තරම් වෙලාවක් විවේක අරන් පහතට එන්න. මගේ ඩ්‍රයිවර් ඔයාව වෝල්ක්ස්වේන් පාරට ගිහින් දාවි"

මට ඒ වෙලාවේ එක පාරමට ඔළුවට ආවේ මගේ වීසා එක. ගෙදර යනවටත් වැඩිය මට එයාගෙන් අහන්න ඕන වුණේ එයා දුන්න පොරොන්දුව ගැන.

"ඩැරෙක්, මම පාස්පෝට් එක අරන් ආවා"

මම ගොත ගැහුවා. මම එයාට කිව්වේ ඇත්ත. එයා මට වීසා හදල දිලා යූටා කැම්පස් එකට දාන්න පොරොන්දු වුණ නිසාම මම ඊයේ ආවේ මගේ ගමන් බලපත්‍රයත් අරගෙනමයි.

"හ්ම්.."

ඩැරෙක් ටික වෙලාවක් කල්පනා කළා.

"ඒක මගේ ඩ්‍රයිවර් වින්සන්ට් ට දෙන්න"

ඒත් එක්කම එයා දුරකථනය විසංධි කරලා දැම්මා. ඒ විසංධි කිරීමත් එක්කම මගේ ඇඟත් සීතල වෙලා ගියා.

"අනේ දෙවියනේ...! මේක එයාට විහිළුවක්වත්, රැවටීමක්වත් වෙන්න එපා. මම මේ තරම් දුකක් වින්දේ ඒ වෙනුවෙන්"

මම ආයෙමත් කෝල් එකක් ගන්න උත්සහ කළා. ඒත් බැහැ. එයා මේ වගේ ඇමතුම් ගන්නේ රහසිගත අංකයකින්. ඒකට ආයෙත් ඇමතුම් ගන්න බැහැ.

මොනවා කරන්නද, ඒවා එහෙම තමයි. අඩුම තරමින් එයා මට කෝල් එකක්වත් දුන්නනේ.

දැන් තියෙන්නේ ඉක්මනටම මෙහෙන් පිටවෙලා යන්න. යන ගමන් ඩැරෙක්ගේ රියැදුරාගේ අතට මගේ පාස්පෝට් එක දෙන්න. එයාව විශ්වාස කරගෙන ඉතිරි දවස් කිහිපය ගත කරන්න.

ඒත් මම කොහොමද එයාව මේ තරම් විශ්වාස කරන්නේ? පාස්පෝට් එක නැතිවුණොත් මාව මේක සදාතනික ආනාථයෙක් වෙනවා. ඒ හැරත්, ඒක උගසට තියාගෙන එයාට පුළුවන් මට ඕන දෙයක් කරන්න. මම කල්පනා කළා....

ඒත් මේක ඇරෙන්න මම වෙන මොනවා කරන්නද?

නැහැ මේ කැප කිරීම අහක යන එකක් නැහැ. මම බුදු හාමුදුරුවන්ව විශ්වාස කරනවා. උන්වහන්සේ මට උදව් කරයි. මම ඉක්මනට ඇඳුම් ටික ඇඳගත්තා. මම ඇඳගෙන ආවේ දිග සායකුයි අත් දිග බ්ලවුස් එකකුයි. ඒවත් ඇඳගෙන මම කාමරයේ ජනේලයෙන් පිටත බැලුවා.

එතකොට මම දැක්කා සුඛෝපභෝගී කාරයක් ගේට්ටුවෙන් නිවසත් එක්ක තිබුණ උද්‍යානයට ඇතුළු වෙනවා. ඒක ඉස්සරහින් කළු පාට ජීප් එකකුත් එනවා. මම ජනේලයේ තිර රෙදි අස්සෙන් ටික වෙලාවක් ඒ දිහා බලාගෙන හිටියා. ඒ කාර් එක නිවස පාමුලට

ඇවිත් නතර කරද්දී කාරයෙන් බැහැපු ආරක්ෂක භටයන් කාරයේ පිටුපස දොර විවර කළා. මට ඒත් එක්කම දුරකථන තිරයේ තිබුණ වෙලාව දිහා බැලුණා. වෙලාව හරියටම 8.30යි. ඒ ඩැරෙක් මේ ගෙදරින් පිටත් වෙන වෙලාව වෙන්න ඕන.

ආරක්ෂක භටයා දොර ඇරලා කාර් එක ඉස්සරහම හිටගෙන හිටියා. ටික වෙලාවකින් ඩැරෙක් ඇවිත් කාර් එකට නැග්ගා. එයා ඇඳන් හිටියේ කළු පාට සූට් එකක්. එයාගේ තඹ පාට කොණ්ඩේ කොට වෙන්නම කපලා. එයා උසයි, කඩවසම්. ඒ වගේම ඇවිදින්නේ හරිම ගාම්භීර විදියට, සෘජුව. මම හිතන්නේ ඩැරෙක්ට වයස අවුරුදු පනහක් විතර ඇති. එයා වාහනයේ ඉඳගෙන විනාඩි කිහිපයකින්ම වාහන දෙකම එතැනින් පිටත් වෙලා ගියා.

මම ආයෙමත් ඇඳේ ඉඳගත්තා. මගේ ඉස්සරහා තියෙන්නේ කන්නාඩි මේසය. ඒකෙන් මගේ මුහුණ හොඳට පේනවා. මම ඒ දිහා ටික වෙලාවක් බලාගෙන හිටියා. මම කළුයි, හරියට අප්‍රිකන් කෙල්ලෙක් වගේ, නහයත් පැතලි වෙලා, කොණ්ඩෙත් ක්‍රේල් වුණානම් හරියටම ඒ වගේ. ඒත් මට තියෙන්නේ උලක් වගේ නහයක්. උරහිස ළඟින් කපලා දාලා ස්ට්‍රේට් කරපු සිනිඳු කළු පාට කොණ්ඩයක්. මගේ ඇස් දෙක..... මගේ අම්මගේ වගේ. ලොකුයි, ඒත් ලස්සනයි. මිනිස්සු කියනවා මම බලද්දි මගේ ඇස් දෙක දිලිසෙනවලු. ඒක ඇත්තක්ද බොරුවක්ද දන්නේ නැහැ. ඒත් මගේ කළු මුහුණේ අමුතු ලස්සනක් තියෙනවා.

මගේ දිහා බලාගෙන ඉඳිද්දී මගේ ඇස් දෙකටම කඳුළු ආවා. මම මගේම මුහුණ දිහා බලාගෙන අඬන්න පටන් ගත්තා. ඒ වෙලාවේ හඬන්න තරම් සිතුවිල්ලක් මගේ හිතට කොහෙන් ආවද මන්දා, ඒත් මම ඇඬුවා.

"ජීවිතය සමහර මිනිස්සුන්ට හැමදේම අහිමි කරනවා... මගේ අම්මා තාත්තා ඒ දෙන්නත් මම පොඩි කාලෙම යන්න ගියා... සමහර විට මගේ රූපය දකිද්දි මට ඒ දෙන්නව මතක් වෙන්න ඇති"

එදා ඩැරෙක්ගේ ඩ්‍රයිවර් මාව ගෙනත් වොල්ස්ක්ස්වීන් වීදියෙන් බැස්සුවා. මේක යූටා වලම කොටසක් වුණාට වොල්ක්ස්වීන් වීදියෙ වැඩියෙන්ම ජීවත් වෙන්නෙ කළු මිනිස්සු. ඒ වගේමයි මත්ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය, අපරාධ, ඒ හැමදෙයක්ම මේ වීදියේ සුලභයි. සමහර වෙලාවට මහාපාරේ වුණත් මිනිස්සුන්ට වෙඩි තියලා මරලා දානවා.

ඇමෙරිකාවට ආවට පස්සේ මම මුලින්ම ජීවත් වුණේ කැලිෆෝනියාවේ. ඒත් ඒ වියදම් වැඩි නිසා මගේ යහළුවෙක් එක්ක මම යූටා වලට ආවා. මුලින්ම මම මෙහේ සාප්පුවක වැඩ කළා. ඒත් වීසා ඉවර වුණහම ඒ රස්සාවෙනුත් මාව එලවලා දැම්මා. එදා ඉඳන් මම නයිට් ක්ලබ් එකක වේටර් කෙනෙක් වුණා.

නයිට් ක්ලබ් එකක වේටර් කෙනෙක් කියන්නෙත් ගණිකාවකටම තමයි. ඒකේ වෙනසක් නැහැ. වේටර් කම් කළත් සල්ලි කාරයෙක් එන්න කිව්වොත් දෙපාරක් නොහිතා ඒ මිනිහත් එක්ක නිදාගන්නවා. ඒ හැරෙන්න වීසාත් නැතිව, වේටර් කමෙන් ලැබෙන සොච්චම් පඩියකින් කොහොම ජීවත් වෙන්නද?

මට ඩැරෙක්ව මුණගැහුණෙත් ඒ වගේ, මම කැසබලන්කා නයිට් ක්ලබ් එකේ වැඩ කරද්දි. ඒ මීට මාසෙකට කලින්.

කාර් එකෙන් බැස්ස තැන ඉඳන් මගේ ගොඩනැගිල්ලට මීටර් දෙසීයක් විතර දුරයි. ඒ දුර මම හිමිහිට ඇවිද්දා. මම අඩිය තිබ්බේ වේදනාවෙන්. කකුල ඉස්සරහට තියනකොට ඇඳුම මගේ කැපුම් පහරවල් වලට ඇතිල්ලෙනවා. එතකොට වේදනයි. මම සැරින් සැරේ සායත් හද හදා ටිකින් ටික මගේ කාමරය තියෙන ගොඩනැගිල්ල ඉස්සරහට ආවා. එතැනට එද්දි මම දැක්කා 'රික්සෝ' ගොඩනැගිල්ල ඉස්සරහා කකුලකුත් බිත්තියට තියාගෙන හිටගෙන ඉන්නවා.

රික්සෝ අප්‍රිකානුවෙක්. කළු මහත කෙනෙක්. එයා තමයි ගොඩනැගිල්ලේ ඉන්න අයට මත්ද්‍රව්‍ය බෙදන්නේ. මේ වීදියේ

තියෙන හැම ගොඩනැගිල්ලක්ම එකම විදිය. උස තට්ටු හතරයි, දුඹුරු පාටයි. හැම ගොඩනැගිල්ලක්ම එක දිගට එකිනෙක යා වෙවී වීදිය දිගේ ඇදිලා යනවා. මේ හැම ගොඩනැගිල්ලකටම මත්ද්‍රව්‍ය අලෙවිකරුවෙකුත් ඉන්නවා. මම ජීවත් වෙන එක අයිති රික්සොට. එයාට විතරයි ඒකේ අයට මත්ද්‍රව්‍ය විකුණන්න පුළුවන්. එයාගෙන් පිට වෙන කාටවත් මෙතැන බිස්නස් කරන්න අයිතියක් නැහැ.

මම එතැනට ළං වෙද්දිම රික්සෝ කටේ තිබුණ සිගරට්ටුව විසිකරලා බොහෝම වුවමනාවකින් මගේ දිහා බැලුවා. මම පර්ස් එකෙන් ඩොලර් පහේ කොළයක් ඇදලා එළියට ගත්තා ඒක තමයි සංඥාව. ඒත් එක්කම රික්සෝ මගේ දිහාට ඇවිදන් එන්න පටන් ගත්තා. එයා මගේ ළඟට එද්දිම මම විස්සේ කොළේ එයාට දෙන ගමන් LSD පැකට් එක අරන් අතේ ගුලි කරගත්තා.

එච්චරයි....

මේ ගනුදෙනුව මේ විදියට හැමදාම වෙනවා. මේක නැත්නම් මට රෑට නින්ද යන්නේ නැහැ. අනික අදනම් මට මේක කොහොමත් ඕන කරනවා. මේ වේදනාවත් එක්ක මම කොහොම නිදාගන්නද?

---

LSD - lysergic acid diethylamide,

මෙය 1938 වර්ෂයේදී ස්විස්ටර්ලන්ත වෛද්‍යවරයෙකු වන ඇල්බට් හොෆ්මන් විසින් අහඹු අත් හදා බැලීමකින් සොයා ගත් අතර, මුල් කාලයේදී යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේ රෝහල් වල මානසික රෝගීන් සඳහා ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවිතා කරන ලදී. නූතනයේදී එය ඇමෙරිකාව ඇතුළු බොහෝමයක් යුරෝපීය රටවල භාවිතා කරන මත්ද්‍රව්‍යක් බවට පත් වී ඇති අතර LSD අධි භාවිතය මගින් මානසික ව්‍යාකූලතා, ආබාධ, පිළිකා සහ තවත් මාරාන්තික රෝග පවා ඇති වේ.

මෙවැනි මත්ද්‍රව්‍ය කිසිම දිනෙක අත්හදා බැලීමටවත් භාවිතා නොකරන්න. අතිශයින්ම ඇබ්බැයි වන සුළුයි, මාරාන්තිකයි.

---

ගොඩක් මිනිස්සුන්ට රාත්‍රිය කියන්නේ එයාලා ගත කරන දවසින් සුන්දරම කාලය. උදේ ඉඳන් හවස වෙනකන් වැඩ කරන මිනිස්සු රාත්‍රියට ගෙදර ඇවිත් තමන්ගේ බිරිඳවයි දරුවන්වයි තුරුලු කරගෙන නිදියගන්නවා.

ඒත් මට රාත්‍රිය කියන්නේ භයානක හීනයක් වගේ. මම නයිට් ක්ලබ් එකේ වැඩ කරන කාලේ හැමදාකම හවස හය වෙද්දි ක්ලබ් එකට යනවා. ඒ ගිහින් හත වෙද්දි ඇඳුම් මාරුකරගෙන වැඩ පටන් ගන්න ඕන. රස්සාවට වේටර් වුණාට සමහර වෙලාවට අපි ගණිකාවන්ටත් වඩා අන්තයි. ගණිකාවට තියෙන්නේ කකුල් දෙක පළල් කරලා ඇස් දෙක වහගන්න. ඒත් අපිට, අපි කොහොමද එහෙම කරන්නේ? ඇස් දෙක ඇරගෙන ඉඳිද්දිම පිරිමින් අපේ ඇඟ අතගානවා, තට්ටමෙන් අල්ලනවා, පියයුරු මිරිකනවා. කෙලින් හිටගන්නවත් බැරිවෙන තරමට අන්තෙටම පදම් වෙච්ච ඔවුන් උන්ගේ කුණු කෙළ පෙරාගත්තු තොල් වලින් අපිව ඉඹින්න හදනවා. ඒ වෙලාවල් වලට අතින් පයින් ඇනලා හරි කොහොම හරි බේරෙනවා හැරෙන්න වෙන කරන්න දෙයක් නැහැ. ඒත් වී අයි පී කස්ටමර් කෙනෙක්නම් ඒකත් කරන්න බැහැ. ඒ තිරිසනා මොනවා කරත් කට වහගෙන ඉන්න ඕන. ගොඩක් වෙලාවට වී අයි පී ලා කරන්නේ නයිට් ක්ලබ් එකට ඇවිත් ටිකක් වෙලා පදම් වෙවී ඉඳලා කෙල්ලෙක්වත් තෝරගෙන හෝටලයකට එක්ක යන එක. ක්ලබ් එකේ නීති වලට උණුව ඒවට තහනමක් නැහැ. ඒත් සාමාන්‍ය කස්ටමර් කෙනෙක් එක්ක අපිට නිදාගන්න තහංචි. උන් අපිව ඇල්ලුවත් ගහලා හරි එතැනින් මාරු වෙන්න ඕන. ඒවට කිසිම නීති රෙගුලාසියක් නැහැ.

මම පැකට් එක ඇරලා ස්ටිකරේ අරන් දිවේ තියාගත්තා. ඒක ටිකෙන් ටික දිවටම දියවෙලා යද්දි මම ඇස් දෙකත් වහගෙන සෝපාවට හේත්තු වුණා. රික්සෝගේ ඒවා කොහොමත් හොඳයි. ඩොලර් පහක් ස්ටිකරයකට කොහෙත්ම පාඩු නැහැ. මම මේකට පුරුදු වුණේ නයිට් ක්ලබ් එකේදි, ඒකේ වැඩ කරන කෙල්ලන් ගොඩක් ස්ටිකර් දිවගාන්න පුරුදු වෙලා හිටියා. සමහරු නම්